රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 19/2017(I)

මගේ අංකය : IAD/3/MAINT/GA02/021-12
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.11.01

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිසාපති/දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**"අපිම අරඹමු - ඩෙංගු දුරලමු, ජාතික සංග්‍රාමයට එක්වෙමු"**
**2017.11.09 සහ 2017.11.10 දෙදින පැවැත්වෙන ඒකාබද්ධ වැඩසටහන**

උක්ත කරුණ සම්බන්ධව 2017.10.31 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවති සාකච්ඡාව හා බැඳේ.

02. මාගේ 2017.07.19 දින දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 19/2017 මගින් දැනුම්වත් කළ පරිදි පසුගිය කාල වකවානුව තුළ රටේ පැවති ඩෙංගු ව්‍යසනය දුරලීම සඳහා රාජ්‍ය, පළාත් සභා, පළාත් පාලන ආයතන හා අර්ධ රාජ්‍ය ආයතන මගින් ලබා දුන් දායකත්වය හා සහයෝගයට පළමුව කෘතඥතාව පළ කරමි.

03. රටේ දැනට පවතින කාලගුණික තත්ත්වය මත ඩෙංගු උවදුර යළිත් හිස ඔසවන බවට ප්‍රදේශ කිහිපයකින් වාර්තා වී ඇත. මෙම තත්ත්වය තවදුරටත් පැතිරයාම වැළැක්වීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් අදාළ සියලුම ආයතන සම්බන්ධීකරණයෙන් 2017.11.09 සහ 10 දින දෙකෙහි ඩෙංගු මර්දන ඒකාබද්ධ වැඩසටහනක් රට පුරා ක්‍රියාත්මක කිරීමට තීරණය කර ඇත.

04. ඒ අනුව සියලුම රාජ්‍ය ආයතන පරිශ්‍ර තුළ (රෝහල්, පාසල් ඇතුළුව) ඩෙංගු මදුරුවන් බෝවීම පාලනය කිරීම සඳහා, මදුරු කීටයන් බෝවන ස්ථාන හඳුනාගෙන සියලුම රාජ්‍ය සේවකයින්ගේ සක්‍රීය දායකත්වයෙන් ඒවා පිරිසිදු කිරීමට 2017.11.09 හා 10 දෙදින තුළ අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කොට මෙම ජාතික කර්තව්‍යයට සහයෝගය ලබා දෙන ලෙස නැවතත් කාරුණිකව ඉල්ලා සිටිමි.

05. මෙම චක්‍රලේඛය ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ හා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ද එකඟත්වය මත නිකුත් කරනු ලැබූ බව තවදුරටත් දන්වා සිටිමි.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් :- 1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය - 2017/10/31 දින පැවති සාකච්ඡාව පරිදි කාරු.දැ.ගැ.පි.
2. අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය - කාරු.දැ.ගැ.පි.